SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# AA1 විභාගය - 2018 ජනවාරි

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංක (AA13)

# ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව
# (EBA)

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
අංක 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## AA1 විභාගය - 2018 ජනවාරි
## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**

**(මුළු ලකුණු 40)**

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්න අංකය | උත්තරය |
|---|---|
| 1.1 | 1 |
| 1.2 | 4 |
| 1.3 | 4 |
| 1.4 | 1 |
| 1.5 | 4 |
| 1.6 | 4 |
| 1.7 | 2 |
| 1.8 | 3 |
| 1.9 | 2 |
| 1.10 | 4 |
| 1.11 | අසත්‍යයි |
| 1.12 | අසත්‍යයි |
| 1.13 | සත්‍යයි |
| 1.14 | සත්‍යයි |
| 1.15 | සත්‍යයි |
| 1.16 | වෙළෙඳපොළ |
| 1.17 | ආන්තික නිෂ්පාදනය |
| 1.18 | නිෂ්පාදන අතිරික්තය |
| 1.19 | 4% |
| 1.20 | ආර්ථික වර්ධනය |

**(එකකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40)**

**A කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතරකි. (04)
(මුළු ලකුණු 40)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) නිෂ්පාදන සාධක (ආර්ථික සම්පත්) හතර පැහැදිලි කිරීම

**භූමිය**

පොදුවේ ස්වභාවික සම්පත් වශයෙන් සැලකෙන සියලුම දෑ භූමිය නමැති සාධකය තුළ අන්තර්ගත වේ. මෙයට ගංගා, ඇළදොළ, වන සතුන්, ඛණිජ ආදිය ඇතුළත් වේ. එමනිසා 'භූමිය' නමැති සාධකයට අනම්‍ය සැපයුමක් ඇත. අඛණ්ඩ පරිභෝජනය සමහර ස්වභාවික සම්පත්වල ක්ෂය වීමට ද හේතු විය හැකිය. භූමිය නමැති සාධකයේ ඵලදායිතාවය මිනිස් ක්‍රියාකාරකම් නිසා ඉහළ යා හැකිය. නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන අංගයක් ලෙස 'භූමිය' හැඳින්විය හැකිය. භූමිය සඳහා කරනු ලබන ගෙවීම 'කුලිය' නම් වේ.

**ශ්‍රමය**

භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට යොදාගත හැකි සියලුම කායික සහ මානසික සම්පත් ශ්‍රමය වශයෙන් නිර්වචනය කළ හැකිය. ශ්‍රමයට හිමිවන ප්‍රතිලාභය වේතන / වැටුප ලෙස හැඳින්විය හැකිය. ශ්‍රමයේ ස්වභාවය ගත් කල විවිධ වේ. මානව සම්පතෙහි ප්‍රමාණය පහත කරුණු මත රඳා පවතී.

(i) ජනගහනයේ ප්‍රමාණය
(ii) ඔවුන්ගේ සෞඛ්‍ය සහ කාය ශක්තිය
(iii) අධ්‍යාපනය හා කුසලතා

**ප්‍රාග්ධනය**

නිෂ්පාදනය සඳහා භාවිත කරන මිනිසා විසින් නිපදවන ලද සම්පත් 'ප්‍රාග්ධනය' ලෙස හැඳින්වේ. එය සංවර්ධනය කළ හැකි නිෂ්පාදන සාධකයකි. මෙම සාධකයට හිමිවන ප්‍රතිලාභය වන්නේ 'පොලිය'යි. ගොඩනැගිලි, යන්ත්‍ර සහ උපකරණ, වාරිමාර්ග වැනි දෑ ප්‍රාග්ධන සම්පත් වේ. මේවා ඵලදායී නමුත් භාවිතයත් සමග ක්ෂය වීමට බඳුන් වේ.

**ව්‍යවසායකත්වය**

නිෂ්පාදන සාධක සංවිධානය කර ඒවා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමට යොමු කිරීම 'ව්‍යවසායකත්වය' මගින් සිදු කරනු ලබයි. මේ සඳහා හිමිවන ප්‍රතිලාභය වන්නේ 'ලාභය'යි. මෙහිදී ව්‍යවසායකයන් විසින් ව්‍යාපාර කටයුතු සංවිධානය කිරීමේදී අවදානම් දරනු ලබයි.

*(ලකුණු 06)*

(b) i. සමතුලිත මිල

ඉල්ලුම = සැපයුම (Qd = Qs)

100-2p = -50+3p

150 = 5p

**30 = P**

රු. **30/-**

*(ලකුණු 02)*

2. සමතුලිත ප්‍රමාණය

සමතුලිත මිල ඉල්ලුම් ශ්‍රිතයට ආදේශ කිරීම

Qd = 100 – 2p

Qd = 100 – ( 2*30)

**Qd = 40**

*(ලකුණු 02)*

*(මුළු ලකුණු 10)*

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a)

**හීනවන ආන්තික උපයෝගිතා න්‍යාය**

හීනවන අනුපාතයේ දී, මුළු උපයෝගීතාවය ඉහළ යන විට, ආන්තික උපයෝගීතාවය ධන අගයක් ගත්ත ද, එය හීන වේ. පරිභෝජනය කළ අවසාන ඒකකයේ ආන්තික උපයෝගීතාවය ඊට පෙර පරිභෝජනය කළ ඒකකයේ ආන්තික උපයෝගීතාවයට වඩා අවම වේ. මෙය හීනවන ආන්තික උපයෝගීතාවය ලෙස හඳුන්වයි. මුළු උපයෝගීතාවය උපරිම වන විට, ආන්තික උපයෝගීතාවය ශුන්‍ය වේ. තවද, මුළු උපයෝගීතාවය අඩුවන විට ආන්තික උපයෝගීතාවය ඍණ අගයක් ගනී.

උදා :- අයිස්ක්‍රීම් කෝන් එකක පරිභෝජන උපයෝගීතාවය

| පරිභෝජනය කළ අයිස්ක්‍රීම් කෝන් ගණන | මුළු උපයෝගීතාවය | ආන්තික උපයෝගීතාවය |
|---|---|---|
| 1 | 10 | 10 |
| 2 | 19 | 9 |
| 3 | 27 | 8 |
| 4 | 34 | 7 |
| 5 | 40 | 6 |
| 6 | 45 | 5 |
| 7 | 49 | 4 |
| 8 | 51 | 2 |
| 9 | 51 | 0 |
| 10 | 50 | -1 |
| 11 | 48 | -2 |




මෙම තත්ත්වයේ දී පාරිභෝගිකයාගේ අරමුණ වන්නේ උපයෝගීතාවය / තෘප්තිමත්භාවය උපරිම කිරීමයි. නමුත් මෙහිදී ඔහුට සීමාවන් දෙකක් යටතේ කටයුතු කිරීමට සිදු වේ. පළමු කරුණ වන්නේ ඔහුගේ ආදායම සීමාසහිත වීමයි. මෙය අයවැය සංරෝධකය ලෙස හඳුන්වනු ලැබේ. දෙවන කරුණ වන්නේ භාණ්ඩවල වෙළෙඳපොළ මිල ගණන් ඔහුගේ පාලනයෙන් තොර වීමයි.

***(ලකුණු 06)***

(b) ඉල්ලුම කෙරෙහි බලපාන සාධක හතර (04)

- භාණ්ඩයේ මිල
- අනෙකුත් සම්බන්ධිත භාණ්ඩවල මිල ගණන් (ආදේශන සහ අනුපූරක)
- පාරිභෝගිකයාගේ ආදායම
- පාරිභෝගිකයාගේ රුචිය හා කැමැත්ත / පාරිභෝගිකයාගේ අපේක්ෂාවන්
- අනෙකුත් කරුණු
  - i. අනාගත වෙළෙඳපොළ මිලෙහි හැසිරීම
  - ii. වෙළෙඳපොළේ සිටින පාරිභෝගිකයන් ගණන
  - iii. කාලගුණික හා දේශගුණික තත්ත්වයන්
  - iv. සමාජ සහ සංස්කෘතික තත්ත්වයන්
  - v. ප්‍රචාරණය
  - vi. අනුකරණයන්
  - vii. ජනගහනය
  - viii. ආදායම් බෙදීයාම

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**(a)** රාජ්‍ය අයවැය ලේඛනයේ ලක්ෂණ හතරක් (04)

(i) අයවැය ලේඛනයක් සකස් කරනු ලබන්නේ ඉදිරි මූල්‍ය වර්ෂය සඳහාය.

(ii) ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා අපේක්ෂිත වියදම් ඒ තුළ ඇතුළත් වේ.

(iii) වියදම් පියවා ගැනීමට අපේක්ෂිත, ඇස්තමේන්තුගත ආදායම් මූලාශ්‍ර අයවැය ලේඛනයක ඇතුළත් වේ.

(iv) හිඟයක් වේ නම් එය මූල්‍ය කරගන්නා ආකාරය අයවැය ලේඛනයක ඇතුළත් වේ.

(v) අයවැය ලේඛනයක, රාජ්‍ය ආර්ථික හා දේශපාලනික තොරතුරු ප්‍රතිපත්ති ද ඇතුළත් වේ.

*(ලකුණු 04)*

**(b)** රජය විසින් වක්‍ර බද්දක් ලෙස භාණ්ඩයක් සඳහා ඒකක බද්දක් පැනවීමේ ප්‍රතිවිපාක පැහැදිලි කිරීම

**භාණ්ඩයකට විශේෂ බද්දක්..**

යම් රජයක් විසින් වෙළෙඳපොළේ විකුණන ලද භාණ්ඩ ප්‍රමාණයක් මත ඒකක බද්දක් පැනවීමේදී, භාණ්ඩයේ වෙළෙඳපොළ සැපයුම් වක්‍රය බද්දේ වටිනාකමින් වමට විතැන් වේ. එයින් පෙන්නුම් කරන්නේ, බද්ද, සැපයුම් වක්‍රයට පමණක් බලපාන බවයි. පහත රූපසටහනින් පෙන්නුම් කරන්නේ පාරිභෝගිකයා සහ සැපයුම්කරුවා අතර බද්ද බෙදී යන ආකාරයයි.

- කෙසේ වෙතත්, බදු බරේ කොටසක් පාරිභෝගිකයා විසින් දරන අතර සැපයුම්කරු ඉල්ලුමේ සහ සැපයුමේ නම්‍යතාවය මත රඳා පවතී.
- රජය විසින් රු. 15/- ක බද්දක් පැනවූ විට




ඉහත රූපසටහනට අනුව බදු පෙර සමතුලිත මිල රු. 30 ක් වේ. රජය විසින් ඒකකයකට රු. 15 ක බද්දක් පනවනු ලැබේ. එයට හේතුවක් ලෙස සැපයුම් වක්‍රය වමට ($S1$) විතැන් වී ඇත.

රු. 40 දක්වා මිල වැඩි වී ඇත. මෙමගින් අදහස් කරන්නේ රු. 10 ක බදු බරක් පාරිභෝගිකයා විසින් දරන බවයි. ඉතිරි රු. 5 සැපයුම්කරු විසින් උසුලයි.

*(ලකුණු 06)*

*(මුළු ලකුණු 10)*

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**(a) සාපේක්ෂ වාසිය සහ නිරපේක්ෂ වාසිය අතර වෙනස පැහැදිලි කිරීම**

යම් රටකට භාණ්ඩයක් වඩා උසස් තත්ත්වයෙන් සහ තවත් රටකට සාපේක්ෂව ඉක්මනින් නිපදවිය හැකි නම්, එය නිරපේක්ෂ වාසිය යනුවෙන් හඳුන්වනු ලබයි. සාපේක්ෂ වාසිය රඳා පවතින්නේ ආවස්ථික පිරිවැය මතය. එනම්, එක් විකල්පයක් තෝරා ගැනීමෙන් අහිමි වන අනෙකුත් විකල්පවල වටිනාකමයි. යම් රටකට භාණ්ඩයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය අනෙකුත් රටවලට සාපේක්ෂව අඩු නම් එහි සාපේක්ෂ වාසි පවතී.

උදාහරණයක් ලෙස, ප්‍රංශයට සහ ඉතාලියට වයින් හෝ චීස් යන දෙකෙන් එකක් පමණක් නිපදවීමට ප්‍රමාණවත් සම්පත් ඇති යැයි උපකල්පනය කරමු. ප්‍රංශයට වයින් ඒකක 20 ක් හෝ චීස් ඒකක 10 ක් නිපදවිය හැකිය. එහි ආවස්ථික පිරිවැය වන්නේ වයින් ඒකක එකකට චීස් ඒකක භාගයක් හෝ චීස් ඒකක 10 කට වයින් ඒකක 20 ක් බෙදීමයි. එහි චීස් ඒකකයක ආවස්ථික පිරිවැය වන්නේ වයින් ඒකක 02 කි.

ඉතාලියට වයින් ඒකක 30 ක් සහ චීස් ඒකක 22 ක් නිපදවිය හැකි අතර මෙහිදී රටවල් දෙකම නිරපේක්ෂ වාසිය පදනම් කරගනී. එහිදී චීස් ඒකක එකක ආවස්ථික පිරිවැය වන්නේ වයින් ඒකක 1.36 ක් වන අතර වයින් ඒකක එකක ආවස්ථික පිරිවැය වන්නේ චීස් ඒකක 0.73 කි.

වයින් නිපදවීමේදී ප්‍රංශයට සාපේක්ෂ වාසියක් පවතින අතර චීස් නිපදවීමට ඉතාලිය සතුව සාපේක්ෂ වාසියක් පවතී.

***(ලකුණු 04)***

**(b) ජාත්‍යන්තර වෙළෙඳාමේ අවාසි**

i) ආර්ථිකයට අහිතකර සහ හානිදායක භාණ්ඩ රට තුළට ගලා ඒම. උදාහරණ ලෙස සිගරට් වැනි දෑ. ඒ මගින් රටේ වාසය කරන්නන්ගේ සෞඛ්‍යයට අහිතකර දෑ සිදුවිය හැකිය.

ii) මේ මගින් සම්පත් අවසන් වීමක් සිදුවිය හැකිය. අන්තර්ජාතික වෙළෙඳාම භූමියේ ඵලදායිතාවයට සෘජුවම බලපායි.

iii) අවශ්‍ය ප්‍රමාණයටත් වඩා විශේෂීකරණය වීම රටකට ඉතාමත් අවදානම් තත්වයක් ඇතිකළ හැකිය.

iv) කිසියම් රටක දේශීය පරිභෝජනය අනෙක් රටවල් මත රැඳී පැවතීම නිසා අහිතකර ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවිය හැකිය.

v) කිසියම් රටකට අත්වන ප්‍රතිලාභ වෙනත් රටකට අවාසි සහගත තත්වයක් ඇතිකළ හැකිය.

vi) රටවල් අතර තරගකාරීත්වය වැඩිවීම, එම රටවල් අතර සම්බන්ධතා බිඳවැටීමට හේතුවිය හැකිය.

***(ලකුණු 06)***

***(මුළු ලකුණු 10)***

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.
(මුළු ලකුණු 20)

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**(A)**

**(a)** දළ දේශීය වියදම

දළ දේශීය වියදම = පෞද්ගලික පරිභෝජන වියදම + රාජ්‍ය පරිභෝජන වියදම + දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය

දළ දේශීය වියදම = 1,000 + 1,500 + 2,500

**දළ දේශීය වියදම (GDE) = රු. මිලියන 5,000**

*(ලකුණු 04)*

**(b)** වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය

වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය = දළ දේශීය වියදම + ශුද්ධ අපනයන
වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය = 5,000 + 1,300
**වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය = මිලියන 6,300**

*(ලකුණු 02)*

**(c)** වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය

වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය = දළ දේශීය නිෂ්පාදිතය +/- විදේශ ශුද්ධ සාධක ආදායම
වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය = 6,300 + 650
**වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය = මිලියන 6,950**

*(ලකුණු 02)*

**(d)** වෙළෙඳපොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය

වෙළෙඳපොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය = දළ ජාතික නිෂ්පාදිතය – ප්‍රාග්ධන ක්ෂය
වෙළෙඳපොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය = 6,950 – 500
**වෙළෙඳපොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය = මිලියන 6,450**

*(ලකුණු 02)*

(B) රටක් තුළ ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති 2ක් පවතී. එනම්, මූල්‍ය ප්‍රතිපත්ති සහ ෆිස්කල් ප්‍රතිපත්ති වේ. ෆිස්කල් ප්‍රතිපත්තිය මගින් සාර්ව ආර්ථික තත්ත්වයන්ට බලපෑම් කළ හැකි රජයක වියදම් සහ ආදායම් ප්‍රතිපත්ති අදහස් වේ.

ෆිස්කල් ප්‍රතිපත්ති උපකරණ

- බදුකරණය
- රාජ්‍ය වියදම්

- රාජ්‍ය ණය
- අයවැය
- රාජ්‍ය සේවයන්

***(ලකුණු 04)***

(C)

රටක සාමාන්‍ය මිල මට්ටමෙහි අඛණ්ඩව ඉහළ නැගීම උද්ධමනය ලෙස හැඳින්වේ. උද්ධමනයට ප්‍රධාන හේතු වන්නේ ඉල්ලුමෙහි ඇදුණු උද්ධමනය සහ පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනයයි.

**(a) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය**

උද්ධමනය ඇති වන්නේ වර්තමාන මිල මට්ටමේදී සමස්ත සැපයුමට වඩා සමස්ත ඉල්ලුම ඉහළ යාමෙනි. ආර්ථිකයක් මුළු සේවා නියුක්තියෙන් කටයුතු කරන විට, සමස්ත ඉල්ලුමේ සිදුවන ඉහළ යාම, උද්ධමනයක් ඇති වීමට කිසිදු බාධාවකින් තොරව හේතු වේ. ආර්ථිකය තුළ සේවා වියුක්තියක් තිබුණ ද, සමස්ත ඉල්ලුම, නිමැවුමට සාපේක්ෂව සීග්‍රයෙන් ඉහළ යන විට උද්ධමන තත්ත්වයක් ඇති විය හැකිය. විශාල මුදල් ප්‍රමාණයක් අවම භාණ්ඩ ප්‍රමාණයක් හඹා පැමිණීම නිසාය,

**ඉල්ලුම ඉහළ යාමට හේතු**

(a) නිමැවුමේ ඉහළ යන ප්‍රතිශතයට සාපේක්ෂව මුදල් සැපයුමේ ඉහළ යන ප්‍රතිශතය වැඩි වීම
(b) අයවැය ඌණතා පියවීම සඳහා රජය විසින් බැංකු පද්ධතියෙන් ණය ලබාගැනීම
(c) බැංකුවල ණය ප්‍රසාරණය වීම
(d) විදේශ විනිමය ඉපැයුම්වල සහ අපනයන ඉපැයුම්වල ක්ෂණික ඉහළ යාම
(e) උද්ධමන අපේක්ෂාවන් - අනාගත මිල මට්ටමේ සිදුවන ඉහළ යාම් ගණන අපේක්ෂා කිරීම මගින් වර්තමාන ඉල්ලුම ඉහළ යයි.

***(ලකුණු 03)***

**(b) උද්ධමනය අඩු කිරීම සඳහා රටක් විසින් ගත හැකි පියවර තුනක් (03)**

**උද්ධමනය අවම කරන ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය**

01. මූල්‍ය ප්‍රතිපත්ති - ඉහළ පොලී අනුපාතයන්. මේ මගින් ණය ගැනුම් පිරිවැය ඉහළ යන අතර වියදම් අධෛර්යමත් කරයි. මේ මගින් අවම ආර්ථික වර්ධන වේගයක් සහ අවම උද්ධමනයක් ඇති කරනු ලබයි.
02. දැඩි පිස්කල් ප්‍රතිපත්ති - ඉහළ ආදායම් බදු හෝ අවම රාජ්‍ය ගෙවීම් මගින් සමස්ත ඉල්ලුම අවම කර, අවම වර්ධන වේගයක් සහ අවම ඉල්ලුමේ ඇදුණු උද්ධමනයක් ඇති කරයි.
03. මෙමගින් දිගුකාලීන තරගකාරිත්වය ඉහළ නැංවීම අදහස් කරයි. උදා :- පෞද්ගලීකකරණය සහ රෙගුලාසි තොර වීම ව්‍යාපාරවල පිරිවැය පහත හෙළීමට ව්‍යවස්ථාවලින් සහ ඒ මගින් අවම උද්ධමනයක් ඇති කිරීමට උපකාරී වේ.

***(ලකුණු 03)***

***(මුළු ලකුණු 20)***

**C කොටසෙහි අවසානය.**

***Notice :***

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designed especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2017 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*

*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*